රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2026

මගේ අංකය : EST-1/CIRL/03/0001-(I)
රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.02.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**"රටම එකට ජාතික මෙහෙයුම" වැඩසටහනට සමගාමීව "විෂ මත්ද්‍රව්‍ය නිවාරණ සතිය" ක්‍රියාත්මක කිරීම.**

විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම" සම්බන්ධයෙන් නිකුත් කළ 2025.11.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2025 වෙත අවධානය යොමු කරවමි.

02. සමස්ත සමාජයට විෂ මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුව ඇති විනාශකාරී බලපෑම සැලකිල්ලට ගෙන, "රටම එකට ජාතික මෙහෙයුම" වැඩසටහනට සමගාමීව අඛණ්ඩව සිදුකෙරෙන විෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වල සමාරම්භය සනිටුහන් කරමින් 2026 මාර්තු 01 දිනෙන් ඇරඹෙන සතිය **"විෂ මත්ද්‍රව්‍ය නිවාරණ සතිය"** ලෙස ප්‍රකාශයට පත්කිරීමට රටම එකට ජාතික මෙහෙයුම් සභාව තීරණය කර ඇත.

03. විෂ මත්ද්‍රව්‍ය නිවාරණ සතිය තුළ පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ය.

3.1 විෂ මත්ද්‍රව්‍ය අලෙවිය හා බෙදාහැරීම පාලනය කර මර්දනය කිරීම

3.2 විෂ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පිරිස් එම විනාශකාරී ඇබ්බැහියෙන් මුදවාගෙන පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම

04. ඉහත 03 හි අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම සතිය තුළ සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම, ආයතනයකම, සංස්ථාවකම සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයකම නිලධරයන්ගේ දායකත්වයෙන් පහත වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

4.1 කාර්ය මණ්ඩලය, සිවිල් ප්‍රජාව සහ පාසැල් දරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන්

4.2 විෂ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව පුළුල් සමාජ කතිකාවක් නිර්මාණය කළ හැකි ප්‍රචාරණ වැඩසටහන්

4.3 නිලධරයන් සහ ප්‍රජාව සම්බන්ධ කරගනිමින් සිදුකෙරෙන වැඩසටහන්

4.4 බස් රථ, ත්‍රීරෝද රථ හා පාසැල් ළමුන් ප්‍රවාහනයේ නිරත වන වාහන සම්බන්ධ කර ගනිමින් විවිධ ප්‍රචාරක වැඩසටහන්

4.5 අවස්ථාවට සහ ප්‍රදේශයට ගැලපෙන මෙන්ම තේමාවට අදාළ හඳුනාගත් වෙනත් වැඩසටහන්

මෙම රාජ්‍ය පරිපාලන
රාජ්‍ය 07/2026 චක්‍රලේඛය/
උපදෙස් ලිපිය 2026.02.23 දින සිට දකුණු
පළාත්සභාවට අදාළ කර ගැනීම
සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය 2026/03/06 දින ලැබී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/පරි නි.

05. විෂ මත්ද්‍රව්‍ය භාවිතයට පොළඹවන සියලු ආකාරයේ ප්‍රවණතා පරාජය කර, ශ්‍රී ලංකාව තුළින් විෂ මත්ද්‍රව්‍ය භාවිතය මුලිනුපුටා දැමීමට උපකාරී වන ආකාරයේ සැලසුම්සහගත වැඩසටහන් ක්‍රියාත්මක කර **"විෂ මත්ද්‍රව්‍ය නිවාරණ සතිය"** සාර්ථක කර ගැනීමට අවශ්‍ය දායකත්වය ලබා දෙන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

මෙම රාජ්‍ය පරිපාලන
අංක 07/2026 චක්‍රලේඛය;
උපලේඛන [illegible] දින සිට දකුණු
පළාත්සභාවට අදාළ කර ගැනීම
සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය 2026/04/06 දින ලබා දී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/පරි නි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ad-1-est@pubad.gov.lk